# ගද්දූලබද්ධ සූත්‍රය (1)

17.04.21 - ශ්‍රී ලංකාරාමය

නවසීලන්තය

මේ සූත්‍රය විපස්සනාවට බරයි. ධර්මාවබෝධය කර ගැනීමට හේතු වෙනවා, උපකාර වෙනවා. ජීවිතය අවබෝධ කර ගැනීමට හේතු වෙනවා. ඒවගේම නාම රූප ධර්මයන් අවබෝධ කර ගැනීමට හේතුවන විශේෂ සූත්‍ර දේශනාවක්. ඒක නිසා මේ සූත්‍ර දේශනාවේ කරුණු හොඳින්ම වටහා ගැනීමට රත්නත්‍රයේ ආශීර්වාදය ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. අද මම මේ පින්වතුන්ට කියලා දෙන්නේ මෙන්න මේ කාරණා ටික.

එක තැනක බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා **"අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං"**

=

"මහණෙනි අනවරාග්‍ර සංසාරයේ කෙලවරක් පේන්නේ නෑ. අවිද්‍යාවෙන් වැහිච්ච තණ්හාවෙන් බැදිච්ච ප්‍රතිසන්ධියෙන් චුතියට, චුතියෙන් ප්‍රතිසන්ධියට යන සත්වයාගේ පළමු කොනක් ආරම්භක ස්ථානයක් පේන්නේ නෑ".

අපි ඔක්කෝම තණ්හාවෙන් බැඳිලා ඉන්නේ. ඒ **තණ්හාවෙන්** බැදිච්ච තැන අපි තේරුම් ගන්න ඕනෑ. තණ්හාවෙන් බැඳිලා තිබෙන්නේ අවිද්‍යාවෙන් වැහිලා නිසයි. අපි තණ්හාවෙන් බැඳිලා තිබෙන තැන, අපි අහුවෙච්ච තැන මොකක්ද කියලා අපිට තේරෙන්නේ නෑ. ඒකට හේතුව **අවිද්‍යාවෙන්** වැහිලා නිසයි. මේ සංසාරයේ ප්‍රතිසන්ධියෙන් චුතියට, චුතියෙන් ප්‍රතිසන්ධියට යන සත්වයාගේ පළමුකොනක්, ආරම්භක ස්ථානයක් පේන්නේ නෑ කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

සමාන්‍යයෙන් අපි ව්‍යවහාරික භාෂාවෙන් කථා කළොත් **උපදිනවා මැරෙනවා - උපදිනවා මැරෙනවා නැවත උපදිනවා නැවත මැරෙනවා**. මේ ක්‍රියා වලිය දිගට දිගට සිද්ධ වෙනවා. මෙන්න මේ දිගට දිගට ඉපදෙමින් මැරෙමින් යන සත්වයාගේ මුල් කෙළවර පේන්නේ නෑ කියලා දේශනා කරනවා.

බුදුරජාණන්වහන්සේ මේ දේශනාව කරලා ඊට පස්සේ වෙනත් පොඩි කථාවක් කියනවා. ඒකත් හරි අපූරුයි.

**හොති ඛො සො භික්ඛවෙ, සමයො යං මහාසමුද්දො උස්සුස්සති විසුස්සති න භවති** = මහණෙනි එක්තරා කාලයක් එනවා, එක්තරා සමයක් උදාවෙනවා මේ මහා සමුද්‍රය සම්පූර්ණයෙන්ම හිඳිලා වියළිලා නැතිවෙලා යනවා. එතකොට මුහුදක් කියලා දෙයක් නෑ.

අපි කියනවා මහා සාගරය කියලා. මේ මහා සාගරය මහා සමුද්‍රය කවදාහරි දවසක වියළිලා යනවා. මහා සාගරය ගැන මේ විදියට දේශනා කරලා උන්වහන්සේ ඊළඟට මේසේ දේශනා කරනවා.

**න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි** = මහණෙනි මහා මුහුද හිඳිලා සම්පූර්ණයෙන්ම වියළිලා යයි නමුත් මේ සංසාරයේ යන සත්වයන්ගේ දුක් කෙලවරක් වෙන්නේ නෑ.

මේ තමයි පළවෙනි උපමාව.

දෙවන උපමාව - '**හොති ඛො සො භික්ඛවෙ, සමයො යං සිනෙරුපබ්බතරාජා උඩ්ඩය්හති විනස්සති න භවති. න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි**' = 'ලොකුම පර්වතය වශයෙන් කියන සිනේරු පර්වතය කවදාහරි දවසක සම්පූර්ණයෙන් දැවිලා පිච්චිලා කන්දක් නෑ කියන තත්වයට පත්වෙනවා. ඒ මහා මේරු පර්වතය

සම්පූර්ණයෙන් දැවිලා නැතිවෙලා පිච්චිලා විනාසවෙලා ගියත් තණ්හාවෙන් බැඳිච්ච අවිද්‍යාවෙන් මුලා වෙච්ච මේ සත්වයන්ගේ දුක් නම් කෙලවර වෙනවා කියලා එකක් නෑ'.

බුදුරජාණන්වහන්සේ තවත් උපමාවක් දෙනවා.

**'හොති ඛො සො භික්ඛවෙ, සමයො යං මහාපඨවී උඩ්ඩය්හති විනස්සති න භවති න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි'** = 'මේ මහා පොළොවත් එක්තරා කාලයකදී දැවිලා පිච්චිලා අළුවෙලා විනාසවෙලා නැති තත්වයටම පත්වෙලා යනවා. එහෙම උනත් මේ තණ්හාවෙන් බැඳිච්ච අවිද්‍යාවෙන් මුලා වෙච්ච මේ සත්වයන්ගේ සසර දුක් කෙලවර වෙනවා කියලා එකක් නෑ'.

මේක හරිම පුදුම කථාවක්. මේ වනවිට මේ වගේ ලෝක ධාතු, මේ වගේ මහා පෘතුවි කීයක් පාස් කරගෙන අපි ඇවිල්ලා ඇත්ද? මේ වගේ පොළෝ ධාතුවල මොනවගේ තත්ව වල අපි හිරවෙලා ඉඳලා ඇත්ද? කොච්චර කුඹුරු කරලා ඇත්ද? කොච්චර ගොඩ නැගිලි හදලා ඇත්ද? ගොඩ නැගිලි වලට කොච්චර රණ්ඩු වෙලා ඇත්ද? ඉඩ කඩම් වලට කොච්චර රණ්ඩු වෙලා ඇත්ද? පොඩි වතුර කඩිත්තියකට කොච්චර රණ්ඩු වෙලා ඇත්ද? කෝ දැන් ඒවා? එකක් වත් නෑ. ඒවගේ මහා පොළොව තලවල තැන් තැන් වල අපි ඉපදිලා ඇති. ගෙවල් හදලා ඇති. දැන් ඒ ගෙවලුත් නෑ. මහා පොළෝ තල එකක්වත් නෑ. ඒවා ඔක්කොම දැවිලා විනාශ වෙලා ගිහිල්ලා. නමුත් අපි තවම මේකේ දිගින් දිගට යනවා.

මේ විදියට බුදුරජාණන්වහන්සේ කරුණු තුනක් දේශනා කළා. ඉස්සෙල්ලාම කියපු කාරණය තමයි මහණෙනි මේ තණ්හාවෙන් බැඳිලා ඉන්න අවිද්‍යාවෙන් වැහිලා ඉන්න සත්වයන්ගේ පූර්ව කෙලවර කොච්චරයිද කියලා කියන්න බෑ කියලා.

නැවත බුදුරජාණන්වහන්සේ මේ විදියට දේශනා කරනවා.

**සෙය්‍යථාපි භික්ඛවෙ සා ගද්දූලබද්ධො දළ්හෙ ඛීලෙ වා ථම්භෙ වා උපනිබද්ධො තමෙව ඛීලං වා ථම්භං වා අනුපරිධාවති, අනුපරිවත්තති.**

දැන් බුදුරජාණන් වහන්සේ බල්ලෙක් ගැන දේශනා කරනවා. ගද්දූල බද්ධ කියලා කියන්නේ වැලකින් කණුවකට හරි මොකක් හරි එකකට බැඳපු බල්ලෙකුට. කණුවකට බැඳපු මේ බල්ලා ඒ කණුව වටේ දුවනවා. මේ බල්ලා එහෙට මෙහෙට දිව්වත් හැම වෙලේම කණුවට බැඳිලා ඉන්නේ. එයා එතැනින් ගැළවී යන්නේ නෑ.


මේ බල්ලා නිදා ගත්තත් නිදා ගන්නේ ඒ කණුව ළඟ, කණුවට සම්බන්ධ වෙලා. දිව්වත් කණුවට සම්බන්ධ වෙලා ඒ සීමාව තුල දුවන්නේ. හැම වෙලේම එයා ඒ කණුවට, ඒ ස්ථම්භයට බැඳිලා ඉන්නේ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ අස්සුතවත් පෘථග්ජනයා ගැන මෙසේ දේශනා කරනවා

**එවමෙව ඛො භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො** = ධර්මය දන්නේ නැත්තා වූ අස්සුතවත් පෘථග්ජනයා
**අරියානං අදස්සාවී** = ආර්යන් වහන්සේලා දැකලා නැති පෘථග්ජනයා
**අරියධම්මස්ස අකොවිදො** = ආර්ය ධර්මය සම්බන්ධයෙන් දක්ෂතාවයක් නැති පෘථග්ජනයා
**අරියධම්මෙ අවිනීතො** = ආර්යන් වහන්සේලාගේ ධර්මයේ හික්මිච්ච නැති පෘථග්ජනයා
**සප්පුරිසානං අදස්සාවී** = සත්පුරුෂයන් දකින්නේ නැති පෘථග්ජනයා
**සප්පුරිසධම්මස්ස අකොවිදො** = සත්පුරුෂ ධර්මයෙහි දක්ෂනැති කෙනා
**සප්පුරිසධම්මෙ අවිනීතො** = සත්පුරුෂ ධර්මයෙහි හික්මිච්ච නැති අස්සුතවත් පෘථග්ජනයා අර කණුවකට බැඳලා ඉන්න බල්ලා වගේ කියලා දේශනා කරනවා.

ආර්යන් වහන්සේලාගේ ධර්මය දකින්නේ නැති, අහන්නේ නැති, හිතන්නේ නැති, මෙනෙහි කරන්නේ නැති, ධර්මයේ හික්මෙන්නේ නැති එක්කෙනා, **රූපං අත්තතො සමනුපස්සති** = රූපය ආත්මයක් හැටියට

සලකනවා. **රූපවන්තං වා අත්තානං** = ආත්මය රූපවත් කියලා සලකනවා. **අත්තනි වා රූපං** = ආත්මය ඇතුලේ රූපය තිබෙනවා කියලා සලකනවා. **රූපස්මිං වා අත්තානං** = රූපය ඇතුලේ ආත්මය තිබෙනවා කියලා සලකනවා.




කණුවකට බැඳලා ඉන්න බල්ලා

ඉන්දියානු සමාජයේ සාමාන්‍ය මිනිස්සු ජීවත්වන ගම්මාන වල තිබෙන සජීවී දර්ශන තමයි මිනිස්සු වැඩට යනවා, කාන්තාවෝ දර කඩන්න යනවා, මිනිස්සු වතුර ගෙන යනවා, වතුර ගලාගෙන යනවා, ළිං තිබෙනවා, ඇලවල් කුඹුරු තිබෙනවා. ගෙවල් වල බල්ලෝ ඉන්නවා. පොඩි ළමයි ලපටි ඉන්නවා. දැන් මේ බුදුහාමුදුරුවෝ මේ දේශනා කරන්නේ ගෙදරක බැඳලා ඉන්න බල්ලෙක් ගැන. මනුස්සයාගේ හිතකට හරි ලේසියෙන් convey කරන්න පුලුවන් නිසා බුදුරජාණන්වහන්සේ මේ උපමාව ගන්නවා.

මේ කණුවට බැඳලා ඉන්න බල්ලා දුවනවා නම් දුවන්න පුළුවන් ඒ කණුව වටේට පමණයි. කණුව වටේට හැර කොහේවත් යන්න බෑ. ඒ බල්ලා කොයි පැත්තට පැන්නත් කණුවට බන්ධන වෙලා ඉන්නේ. තථාගතයන් වහන්සේගේ ධර්මය දන්නේ නැති අස්සුතවත් පෘථග්ජනයා මේ ඇඟට, මේ ශරීරයට, මේ රූප ස්කන්ධයට මේ වගේ අදහසක් දානවා. ඒ තමයි ඒ **රූපය ආත්මයක්** කියලා හිතා ගන්නවා.

රූපය ආත්මයක්ය කියලා හිතා ගන්න එක දෘෂ්ඨියක්. රූපය කියන එක ආත්මයක් කියලා හිතා ගත්තේ කරුණු දෙකක් හින්දයි. අර බල්ලා කණුවට බැඳුණා වගේ සත්වයා දෘෂ්ඨියෙන් රූපයට බැඳිලා ඉන්නේ. මෙයා හිතනවා ඒ රූපය ආත්මයක් කියලා. ඒක දෘෂ්ඨියක්.



එයා ඒ විදියට හිතා ගන්නේ කරුණු දෙකක් හින්දා. එකක් තමයි ඒ රූපයේ හැඩ වැඩ එයාට තේරෙන්නේ නෑ. ඒකට කියනවා **අවිද්‍යාවෙන් වැහිලා** කියලා. අවිද්‍යාව නිසා තමයි එයාට රූපය තේරෙන්නේ නැත්තේ. අවිද්‍යාවෙන් වැහිච්ච නිසා එයා හිතා ගන්නවා ඒක ආත්මය කියලා. රූපය ආත්මය කියලා හිතාගෙන ඊට පස්සේ ඒකට තණ්හා කරනවා.

අපේ හිත අපේ ශරීරයට බැඳෙනවා. අපේ ශරීරය කණුවක් කියලා හිතා ගත්තොත් ඒ කණුවට අපේ හිත බැඳෙනවා. බැඳෙනවා කියලා කියන්නේ ශරීරයට තණ්හාව ඇතිවෙනවා. ඒක නිසා අපි රූපය අතහරින්නේ නෑ. බල්ලා කණුවට බැඳිලා ඒක අතහරින්නේ නෑ වගේ අපිට රූපය අතහරින්න බෑ. අපේ හිත තණ්හාවෙන් තදින් බැඳිලා තිබෙනවා කියලා අපි දන්නෙත් නෑ. ඒ තරම් තදින් බැඳිලා ඉන්න රූපයේ ඇත්ත ස්වභාවය අපි දන්නෙත් නෑ. ඒක නිසා ඒක අතහරින්න බෑ, රූපය සත්වයෙක් ආත්මයක් කියලා ගන්නවා.


මේ කාරණාව පහසුවෙන් තේරුම් ගන්න බැරි ටිකක් ගාම්භීර කාරණාවක්. ඉස්සෙල්ලාම ආත්මය (self – soul) කියන එක තේරුම් ගන්න. මේ ලෝකයේ ආත්ම කථාවක් තිබෙනවා. ඒ අය කියන ඒ ආත්මයට qualities තිබෙනවා. මිනිස්සුත් කථා කරන අපිත් හිතෙත් පිලිගන්න ඒ ආත්මය මෙවැනි ලක්ෂණ වලින් යුතුයි කියලා කියනවා.

ආත්මය / Self / Soul } =

1) වෙනස් වෙන්නේ නෑ
2) පුච්චන්න බෑ
3) කපන්න බෑ
4) කැඩෙන්නේ නෑ
5) මැරෙන්නේ නෑ

වෙනස් වෙන්නේ නැති, කැඩෙන්නේ නැති, බිඳෙන්නේ නැති, පුච්චන්න බැරි, මොකක්වත් කරන්න බෑ කියන අර්ථයෙන් කියනවා **ආත්මය** කියලා. තවත් මේකට කියන නම් ගොඩක් තිබෙනවා. ජීවය කියලා කියනවා, සත්වයා කියනවා, පුද්ගලයා කියනවා. ඔය වගේ ගොඩක් නම් කියනවා.


පුච්චන්න බැරි, පිච්චෙන්නේ නැති, කඩන්න බැරි, කැඩෙන්නේ නැති, දිරන්නේ නැති මේ ආත්මය රූපය කියලා හිතනවා.



(1) **රූපං අත්තතො සමනුපස්සති** = රූපය ආත්මයක් ලෙස සළකනු ලැබේ. මේ මුළු රූපයම වෙනස් වෙන්නේ නැති කැඩෙන්නේ නැති මොකක්වත් වෙන්නේ නැති දෙයක් කියන අර්ථයෙනුයි ආත්මයක් ලෙස සලකන්නේ. නමුත් අපිටම පේනවා මේ රූපය වාහන වල හැප්පිලා කැඩිලා තිබෙනවා. නමුත් මිනිස්සු හිතාගෙන ඉන්නේ මේ රූපය කැඩෙන්නේ නැති පිච්චෙන්නේ ආත්මයක් කියලා. අපි හොඳටම දැකලා තිබෙනවා බෝම්බ වැදිලා රූපය කැඩිලා තිබෙනවා.

ඒක නිසා මේ 'රූපය ආත්මයක් ලෙස සළකනු ලැබේ' කියන වාක්‍යයට තැනක් නැතිවෙනවා. නුවණින් හිතුවොත් රූපයට කැඩෙන්නේ නැති පිච්චෙන්නේ නැති මැරෙන්නේ නැති ආත්මයක් කියන කථාව ගැලපෙන්නේ නෑ. අතපය කැපිච්ච කැඩිච්ච පොඩි වෙච්ච මිනිස්සු ඉන්නවා. මේ රූපය ආත්මයක් නම් වෙනස් නොවී පොඩි කාලේ විදියටම ඉන්න ඕනෑ. ඒක නිසා ඒ (1) වාක්‍ය වැරදියි.

(1) රූපං අත්තතො සමනුපස්සති = රූපය ආත්මයක් ලෙස සළකනු ලැබේ. X (වැරදියි)




**(2) රූපවන්තං වා අත්තානං** = ආත්මය රූප ගතියෙන් යුක්තයි කියලා කියනවා මේ රූපයේ යම්කිසි ආත්මීය ගතියක් තිබෙනවා කියලා බාර ගන්නවා. එහෙම බැලුවත් ඒක ගලපන්න බෑ. රූපය පිච්චෙනකොට පොඩ්ඩක් වත් ඉතුරු වෙන්නේ නැතුව ඔක්කොම ටික පිච්චෙනවා. අතක් කැඩෙන

කොට සම්පූර්ණයෙන්ම කැඩිලා යනවා. ආත්මීය ගතිය කියන ඒ ගතියටවත් පොඩ්ඩක්වත් ඉතුරු වෙන්නේ නෑ. ඒක නිසා මේ (2) වාක්‍යත් වැරදියි.

| |
|---|
| (2) **රූපවන්තං වා අත්තානං** = ආත්මය රූප ගතියෙන් යුක්තයි **X** (වැරදියි) |

ඉස්සෙල්ලා වාක්‍ය දෙකම හරි ගියේ නැති නිසා ඒ අය තවත් වාක්‍යක් හදාගත්තා.

(3) **අත්තනි වා රූපං** = ආත්මය ඇතුලේ රූපය තිබෙනවා. එතකොට ඒ දෙකක්. ආත්මයක් තිබෙනවා ඒක ඇතුලේ රූපය තිබෙනවා.





මේ දෘෂ්ඨියට අනුව වටිනා පිච්චෙන්නේ නැති ආත්මය නමැති භාජනය තුල නොවටිනා දිරායන රූපයක් තිබෙනවා කියලා පිළිගන්නවා. නමුත් අපි විදර්ශනාවෙන් හොයාගෙන හොයාගෙන යනකොට භාජනයක් නෑ, දිරායන රූපයක් පමණක් තිබෙනවා. ඒක නිසා ඒ පිළිගැනීමත් (3) වැරදියි.

| |
|---|
| (3) **අත්තනි වා රූපං** = ආත්මය ඇතුලේ රූපය තිබෙනවා **X** (වරදියි) |

ඊළඟ කාරණය

| |
|---|
| (4) **රූපස්මිං වා අත්තානං** = රූපය ඇතුලේ ආත්මය තිබෙනවා **X** (වැරදියි) |

මේ දෘෂ්ඨියට අනුව සමහර අය හිතනවා ශරීරය භාජනයක් නම් කැඩෙන්නේ නැති පිච්චෙන්නේ නැති ආත්මය ඒ ශරීරය නමැති භාජනය තුල ඉන්නවා කියලා.





දැන් බලන්න මේ ආත්ම කථාව නිසා හැම වෙලාවේම අපේ හිත රූපයෙන් අයින් වෙන්නේ නෑ. අයින් වෙන්නේ නැත්තේ පිටින් හරි ඇතුලෙන් හරි සම්බන්ධ වෙලා ආත්මයක් තිබෙනවා කියලා හිතලා රූපයටම බැඳෙන නිසා. හරියට අර බල්ලා කණුවට බැඳීලා ඉන්නවා වගේ. ඌ කොහේ දිව්වත් දුවන්නේ කණුව වටේ. ඒවගේ අපි මොන තර්ක දැම්මත් මොන ආත්ම කථා කිව්වත් දුවන්නේ අපේ රූපය වටේ.

ඒ නිසයි බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ අස්සුතවත් පෘථග්ජනයා කණුවක බැඳපු බල්ලා වගේ කියලා.

අපිත් හැම වෙලේම ඔය චින්තනය දාගෙන ඔය දෘශ්ඨි දාගෙන තමයි ඉන්නේ. ආත්මීය ප්‍රකාශන දදා අපි නිතරම connect වෙන්නේ රූපයට. ඒක නිසා අපි රූපය අතහරින්නේ නෑ. අතහරින්නේ නැත්තේ අපි රූපයට තණ්හා කරන නිසා. රූපයට බැඳිච්ච නිසා. ආත්මයට ඉන්න භාජනයක් හැටියට හරි රූපය තියා ගන්න ඕනෑ නිසා. නැත්නම් ආත්මය නමැති භාජනයේ තිබෙන රූපය කියලා හරි තියා ගන්න ඕනෑ. හැම වෙලාවේම මේ රූපයට බැඳෙන විදියක් තමයි තිබෙන්නේ. ඉන් එහාට ගැලවිලා යන්නේ නෑ.

අපි මේ රූපයට බැඳෙන්නේ ඔය කියන දේවල් මේ රූපය ඇතුලේ නැති බව තේරෙන්නේ නැති නිසා. ඔය කියන ආත්මයක් මේ රූපය පිටත් නෑ, රූපය ඇතුලෙත් නෑ කියලා තේරුම් ගන්න තරම් අපිට නුවණක් දැනුමක් නෑ. ඒක නිසා කියනවා අපි අවිද්‍යාවෙන් වැහිලා කියලා. අවිද්‍යාවෙන් වැහුන අය තමයි මේ වගේ අදහස් ප්‍රකාශ කරන්නේ. ඒ අයට කියනවා ආර්යන් වහන්සේලාගේ ධර්මය දන්නේ නැති **අස්සුතවත් පෘථග්ජනයා** කියලා. ඒ අය තමයි මේ හතර ආකාරයට කථා කරමින් රූපයට ඇලෙන්නේ.

අවිද්‍යාව නිසා ඇත්ත නොතේරෙන තරමටම තණ්හාවෙන් බැඳීම වැඩි වෙනවා. මේ හතර ආකාරයකටම කියන දේවල් පිළිබඳව බුදුරජාණන්වහන්සේ පරික්ෂා කරලා බැලුවා.




උන්වහන්සේ දැක්කා මේ කියන ඒවා එකක්වත් නැති බව. ඒක නිසා මේවා ලෝකයේ තිබෙන දෘෂ්ඨි පමණයි.

මේ විදියටම වේදනාව පිළිබඳවත් දෘෂ්ඨි තිබෙනවා. රූපය පිළිබඳ කියන ප්‍රකාශන ඔප්පු කරන්න බැරිනිසා සමහර අය වේදනාව තමයි ආත්මය කියලා ප්‍රකාශ කළා.

- සමහර අය කිව්වා **විඳීමම තමයි ආත්මය කියලා.**
- සමහර අය කිව්වා **විඳීම කියන එක ආත්මීය ගතියෙන් යුක්තයි කියලා.**
- සමහර අය කීව්වා **ආත්මය ඇතුලේ තමයි වින්දනය තිබෙන්නේ කියලා.**
- තවත් සමහරු කිව්වා **වේදනාව තිබෙනවා. ඒක තමයි basket එක. ඒකෙ ඇතුලේ තමයි ආත්මය තිබෙන්නේ කියලා.**

හරියට අර කණුව වටේ කරකැවෙන බල්ලා වගේ අපිත් මේ ස්කන්ධ පංචකය වටේම කරකැවෙනවා. කවදාකවත් මේ පහෙන් ගැලවිලා අහකට යන්නේ නෑ. මේ ස්කන්ධ පංචකය වටේම දෘෂ්ඨි දදා දෘෂ්ඨි දදා කැරකි කැරකි ඉන්නවා.

අපි දැන් පොඩ්ඩක් මේ ආත්මීය කථාව පැත්තකින් තියලා මෙහෙම හිතමු. අපි මලක් පහනක් පූජා කරනවා කියලා හිතමු. අපිට අහන්න ලැබෙනවා මල් පූජා කරහම විපාක වශයෙන් දිව්‍යලෝක වල පිච්ච මල් වගේ නෙළුම් මල් වගේ ලස්සන ලස්සන පාට ඇතුව උපදිනවා කියලා. අපි හරිම ලස්සන දිව්‍යාංගනාවක් වේවා කියලා පැතුමකුත් දානවා. අපි දැන් පිනක් කරලා ඉල්ලුවේ ලස්සන රූපයක්. දැන් බලන්න අපි එතැනදීත් රූපයෙන් අහකට ගියේ නෑ. කොයිම වෙලාවකවත් අපි රූපයෙන් අහකට යන්නේ නෑ. හැම වෙලාවේම මෙතැනින් අයින් වෙලා තව තැනක් පැතුවත් එතැනත් ඕනෑ වෙන්නේ රූප පොඩ්ඩක්. ලොකු හරි පොඩි හරි, සූක්ෂම හරි ඕලාරික හරි, පාට හරි අපාට හරි අපිට රූපයක් අවශ්‍යයි. අපි පිනක් කරලවත් රූපය අහක් කරන්නේ නෑ. ඒ පිනේ විපාකයක් හැටියට අපිට අවශ්‍ය වෙන්නෙ රූපයක්. අර බල්ලා බැඳලා ඉන්නේ කණුවට වගේ අපි මෙහෙන් පැනලා ගිය ගමන් නැවත යන්නේ රූපයකට. ඒක නිසා රූපයෙන් එළියට යෑමක් නෑ. අපේ තිබෙන්නා වූ connection එක, අපේ තිබෙන්නා වූ තණ්හාව තදින්ම රූපයට බැඳිලා ගැටගැහිලා තිබෙන්නේ. ඒක නිසා අපි රූපයෙන් අහකට යන්නේ නෑ.

දැන් බලන්න, අපි දිව්‍යලෝකයේ ලස්සන රූපයක් ලබන්න පිංකරන කොට පිං කරන්නේ කැඩෙන බිඳෙන ගඳ ගහන වෙනස් වෙලා යන ශරීරයක් අල්ලාගෙන. එහෙම නම් මෙහෙ තිබෙන්නා වූ මේ ස්වභාවයෙන් යුක්ත වූ කැඩී බිඳී යන වෙනස් වෙන එකක් තමයි එහෙත් ලැබෙන්නේ කියලා හිතන්න අපිට කල්පනාවක් එන්නේ නෑ. ඒකට හේතුව තමයි අවිද්‍යාවෙන් වැහිලා නිසා. අර බල්ලා ඒ බැඳලා ඉන්න කණුවේ මොන පැත්තට ගියත් උතුරට දකුණට නැගෙනහිර බටහිර කොයි පැත්තට ගියත් සම්බන්ධ වෙලා ඉන්නේ ඒ කණුවටයි. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා අන්න ඒ ගද්දූලබද්ධයා වගේ තමයි මේ පෘථග්ජනයාගේ හිත කියලා.

මේ හේතුව නිසා අපි දුවන්නේ රූපයෙන් වේදනාවට, වේදනාවෙන් සංඥාවට, සංඥාවෙන් රූපයට, රූපයෙන් සංස්කාරයට. මේ විදියට පැන පැන මේකෙම තමයි අපි ඉන්නේ. ඒකනිසා කවදාකවත්ම අපිට මේ පහෙන් බේරෙන්න බෑ. ඒක නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා **න පරිමුච්චති රූපම්හා, න පරිමුච්චති වෙදනාය, න පරිමුච්චති සඤ්ඤාය, න පරිමුච්චති සඞ්ඛාරෙහි, න පරිමුච්චති විඤ්ඤාණම්හා, න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. 'න පරිමුච්චති දුක්ඛස්මා'ති වදාමි''.**

යම්කිසි තැනක මේ පහ තිබෙනවානම්, එනම් රූපය ගැට ගැහිච්ච, වේදනාවෙන් තෙරපිච්ච, සංඥාවත් තිබෙන සංස්කාරත් තිබෙන විඤ්ඤාණත් කියන මේ පහ කොහේ හරිතැනක තිබෙනවානම් එතැන අනිවාර්යෙන්ම ජාතිය ජරාව මරණය සෝක වැළපීම සියල්ලම තිබෙනවා. අඬන්න, වැළපෙන්න, දුක් දොම්නස් ඇතිවෙන්න, උපායාස වෙන්න අනිවාර්යෙන්ම පංචස්කන්ධයක් අවශ්‍යයි. ඒකනිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා 'මේ පංචස්කන්ධ තිබෙන තාක් කල් දුකින් මිදෙනවා කියලා මම දේශනා කරන්නේ නෑ' කියලා.

මේ සෑම දෙයක්ම කිව්වේ අස්සුතවත් පෘථග්ජනයා ගැනයි.

නමුත් තවත් කොටසක් ඉන්නවා. ඒ අයගේ වැඩ සටහන වෙනස්. **''සුතවා ච ඛො, භික්ඛවෙ, අරියසාවකො** = ආර්යන් වහන්සේලාගෙන් බණ අසන දකින හිතන, ආර්යන් වහන්සේලාගේ ධර්ම පුරුදු කරන, ඒ ධර්මයට අනුව හැසිරෙන ආර්ය ශ්‍රාවකයා වෙනස්.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය දැනගත්තු ඒ ශ්‍රාවකයා රූපය ආත්මයක් හැටියට සලකන්නේම නෑ. කවුරු කොහොම කිව්වත් මේ රූපයේ ආත්මීය ගතියක් සිනිඳුවට හෝ තිබෙනවා කියලා කිව්වත් එයා පිළිගන්නේ නෑ. ආත්මය ඇතුලේ රූපය තිබෙනවා කියලා කිව්වත් පිළිගන්නේ නෑ. රූපය ඇතුලේ ආත්මය තිබෙනවා කියලා කිව්වත් පිළිගන්නේ නෑ. මේ ස්කන්ධ පහ කෙරෙහිම විසි ආකාරයකින් දක්වන, කපන්න බැරි ආත්මයක් පැත්ත පලාතකවත් නෑ කියලා තේරුම් ගන්නවා. මේ සුතවත් ආර්ය ශ්‍රාවකයා ආත්මීය හැඟීමෙන් රූපය පත පතා යන්නේ නෑ. වේදනාව සංඥාව සංස්කාර විඤ්ඤාණ ප්‍රාර්ථනා කරගෙන යන්නේ නෑ.

කැඩෙන බිඳෙන කඩතොලු සහිත, වැලපීම් ඇතිකරන සෝක උපදවන 'රූප වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණ' මට කුමකටද කියලා මේ සුතවත් ආර්ය ශ්‍රාවකයා මේ සියල්ලගෙන්ම අයින් වෙනවා. රූපයකුත් නැත්නම් වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණ කියන කිසිම දෙයක් නැත්නම් උපදින්න හේතුවක් මොකක්වත් නෑ. ඒක නිසා එයාට ඉපදීමක් නෑ. ඉපදීමක් නැති තැන ජරාවට යෑමක් නෑ, ඇඬීමක් නෑ. දුක් දොම්නස් උපායාස මුකුත්ම නෑ. ඒ අවස්ථාව ගැන බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා **'පරිමුච්චති දුක්ඛස්මා'ති වදාමී''** = දුකින් මිදුනා කියල කියනවා. ඒකනිසා දුකින් මිදෙන්න නම් මේ පහෙන්ම අපි අයින් වෙන්න ඕනෑ.

මේ පහෙන් අයින් වෙනවා කියන්නේ ඒකට තිබෙන connection එක අයින් කරන්න ඕනෑ. ඒ connection එක නිකම්ම අයින් වෙන්නේ නෑ. ඒක නිසා අපි හැම වෙලාවේම මේකේ තිබෙන්නා වූ defects බලන්න ඕනෑ. අපි අත හොඳයි කියලා හිතාගෙන ඉන්නවා. හොඳයි කියලා හිතාගෙන ඉන්න අත විනාඩි කීපයක් ඔසවාගෙන ඉන්න කොට වේදනාවක් එනවා. හොඳයි කියලා ගත්තු අත හොඳ නැති වීගෙන එනවා. ඒවගේ අපි එකක් හොඳයි කියලා ගන්නකොටම ඒකෙ ඇතුලේ තිබෙන හොඳ නැති ගතිය මතුවෙලා එනවා.

බුදුරජාණන් වහන්සේ ගොඩක්ම රූපයේ තිබෙන ආදීනව දේශනා කළේ මේකෙන් මිදිලා යන්නයි. අස්සුතවත් අන්ධ පෘථග්ජනයා රූපයේ තිබෙන ඇදකුද කියනවට කැමති නෑ. අසුභවාදී කියලා කියනවා. නමුත් ඒක තමයි ඇත්ත, reality එක. ඇත්තවශයෙන්ම කියනවානම් මේ ශරීරය damageable. පොඩ්ඩක් අවුවේ ගිය ගමන් කරකැවිල්ල හැදෙනවා. විනාඩි 5 ක් අව්වේ ගෙනියන්න බැරි ආත්මයකින් තිබෙන වැඩේ කුමක්ද? මේ වගේ ඇත්ත කථා කරනකොට මිනිස්සු කැමති නෑ.

ආර්යන් වහන්සේලාගේ ධර්මය දකින අය ඇත්තම ඇත්තට හරි කැමතියි.

හොඳයි, මේ ටික තමයි අද දේශනාව. සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.